www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

### *මෙය ඓතිහාසික සැතපුම් කනුවක් ද?*

# ඇමරිකාව තුල පන්තිය හා වර්ගය ගැන සටහනක්

**A historical milestone?**
**Reflections on class and race in America**

**2008 නොවැම්බර් 7**

බරක් ඔබාමාගේ ජයග්‍රහනය තනිකරම වාර්ගික පදනමක ලා අර්ථ දැක්වීම, ඡන්ද දින රාත්‍රිය ආරම්භයේ සිට ඡන්දය අවසන් වීමෙන් පසුවත් දිගින් දිගට කරගෙනයාම සඳහා ඇමරිකානු ජනමාධ්‍ය ඒකාවන්ව පෙරට ඒම කැපී පෙනෙන කරුනකි. මෙම ප්‍රවනතාවට කදිම නිදසුනක් සැපයුනේ ඇමරිකානු ලිබරල් මතධාරී සංස්ථාපිතයේ ප්‍රධානතම හොරනෑව වන *නිව්යෝර්ක් ටයිම්ස්* පත්‍රය ඩිමෝක්‍රැටික් ජයග්‍රහනයට සැලකූ ආකාරයෙනි. එය පසුගිය බදාදා දැවැන්ත ශීර්ෂපාඨයක් මගින් මෙසේ ප්‍රකාශ කලේයඃ "ඔබාමාඃ තීරනාත්මක ජයග්‍රහනයේ දී වාර්ගික බාධකය බිඳ වැටෙයි."

ජනමාධ්‍යවේදයේ ප්‍රාථමික ප්‍රමිතීන්ට අනුව සැලකූ විට පවා වෛෂයික වාර්තාකරනය ගැන කිසිදු මවාපෑමක් වත් දක්නට නැතිකම සම්බන්ධයෙන් මෙම ශීර්ෂපාඨය අපූර්වත්වයක් දක්වයි. මෙය ප්‍රවෘත්ති ශීර්ෂපාඨයක් නොවේ. ප්‍රධාන ප්‍රවාහයේ ප්‍රවෘත්ති පත්‍රයක් සාමාන්‍යයෙන් මහ මැතිවරනයක ප්‍රතිඵල ඉදිරිපත් කරන ආකාරය මෙය නොවේ.

1960 ඡන්දයේ දී ජෝන් එෆ් කෙනඩි පුනපුනා ප්‍රකාශ කල දෙය නම් ඔහු කතෝලික ජනාධිපති අපේක්ෂක නොව, වඩා නිවැරදිව, ඩිමෝක්‍රැටික් අපේක්ෂක බවයි, නමුත් අහම්බයෙන් කතෝලිකයකු ද වූ බව යි. ධවල මන්දිරය සඳහා ඔහුගේ අපේක්ෂකත්වය පැමිනියේ කතෝලික ඩිමෝක්‍රැටිකයකු වූ ඇල්ෆ්‍රඩ් ඊ. ස්මිත්ගේ දැවැන්ත පරාජයෙන් වසර 32කට පසුව ය. එනමුත්, කෙනඩි, එක්සත් ජනපද ඉතිහාසයේ ජනාධිපතිවරනයක් ජයගත් ප්‍රථම කතෝලික ඩිමෝක්‍රැටිකයා බවට පත්වූ විට ජනමාධ්‍ය ආගමික ප්‍රශ්නය සැලකුවේ අප්‍රධාන තේමාවක් ලෙස ය.

*ටයිම්ස්* සඟරාව මීට විපරීත ලෙස, අඟහරුවාදා ඡන්දය සාකල්‍යයෙන් ම වර්ගය පිළිබඳ ජනමතවිචාරනයක් ලෙස ඉදිරිපත් කිරීමට තෝරා ගත්තේ ය. ඔවුන්ට අනුව එය බුෂ් පාලනතන්ත්‍රය හා රිපබ්ලිකන් පක්ෂයේ දක්ෂිනාංශික දේශපාලනය දැවැන්ත ලෙස ප්‍රතික්ෂේප වීමක්, ඉරාකය හා ඇෆ්ගනිස්තානය තුල යුද්ධයන් ප්‍රතික්ෂේප වීමක්, මූල්‍ය සුපිරි පැලැන්තියේ වැඩිදුර පෝෂනය සඳහා තනිකරම වෙන්වුනු දශක තුනක සමාජ ප්‍රතිපත්ති ප්‍රතික්ෂේප වීමක් නොවුනි, මෙම දෙසාබෑම් නො තකා හරින අවිවාදිත කරුන නම් ඡන්දයේ වඩාත් තීරනාත්මක ප්‍රශ්නය වූයේ, ඔබාමාගේ ජයග්‍රහනය මගින් පෙර පැවති ආර්ථික ප්‍රතිපත්ති වෙත ආපසු හැරීමක් සනිටුහන් වෙතැයි බලාපොරොත්තුවෙන් ඔහුට ඡන්දය දීමට, සියලු වර්ගයන්ගේ, කෝටි ගනනක් වැඩකරන ජනතාව හා තරුනයන් පොලඹවන ලද ආර්ථික අර්බුදය බව යි.

නිමක් නැති පන්ඩිතයන් ගුවන් තරංග අරාගත්තේ ද මෙම එකම වර්ගවාදී මන්ත්‍රය පුනරුච්චාරනයට යි. රිපබ්ලිකන් අපේක්ෂක ජෝන් මැකේන් ද ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව් බුෂ් ද ඡන්දප්‍රතිපල ගැන ඔවුන්ගේ ප්‍රකාශවල දී මෙයාකාරයට ම ඔබාමාගේ වර්ගය ඡන්දය හරිමැද පැවති කරුන ලෙස ඉදිරිපත් කලහ.

ඔබාමාගේ හමේ පාට හා පුද්ගලික පසුබිම අලලා කෙරෙන මෙම නොනවතින මැතිරිල්ල, ඇමරිකාව තුල සාමාන්‍ය දේශපාලන විශ්ලේෂන සියල්ලම වර්ගවාදී වර්ගීකරනයක් තුල ක්‍රියාත්මක වන අලලා ගත් ස්වභාවය මැනවින් පසක් කර දෙයි. නමුත් මෙය තවත් නිශ්චිත දේශපාලන අරමුනු සඳහා ද සේවය කරයි. යුද්ධයට එරෙහි මහජන විරෝධය ද ඇතුලත් ඡන්දයේ දිශාවනතිය තීන්දු කල දේශපාලන කරුනු අකාමකා දැමීමට දරන තැතකට ද මෙය ඉඩ සලසයි. ඔබාමා ආරම්භයේ දී ඔහුගේ විශ්වාසනීයත්වය ගොඩනගාගත්තේ ඉරාකය තුල යුද්ධයට විරුද්ධ අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වීමෙන් යන කරුන සම්පූර්නයෙන්ම වාගේ අමතක කර දමා ඇත.

මෙය නැවත වතාවක්, ඡන්ද කොට්ඨාස තුල ප්‍රතික්ෂේප වුනු දක්ෂිනාංශික ආර්ථික හා විදේශ ප්‍රතිපත්ති දිගට ම පවත්වාගෙන යාමට මග හෙලිපෙහෙලි කර දෙයි. තේරීපත් ජනාධිපතිවරයා එවැනි ගමනක් යාමට සූදානම් වන අයුරු, ඉරාක යුද්ධයට මුල් කාලයේ දී සහාය දැක්වූවෙකු හා චිකාගෝවේ දේපොල වෙලඳාම් හා මූල්‍ය සමාගම්වල සහකරුවෙකු වන කොංග්‍රස් සභික රාම් එමානුවෙල් ඔහුගේ කාර්ය මන්ඩල ප්‍රධානියා ලෙස නම් කිරීමට ඔහු ගත් තීරනය මගින් ද, ඔබාමා අඩුතරමින් තවත් රිපබ්ලිකන් පාක්ෂිකයන් දෙදෙනෙකු වත් ඔහුගේ කැබිනට් මන්ඩලයට නම් කරනු ඇතැයි යන වාර්තා මගින් ද දැනටමත් පැහැදිලි වී ඇත.

ඔබාමාගේ ජයග්‍රහනය වර්ගවාදී වචන මගින් චිත්‍රනය කිරීම ඔහුගේ පිලිවෙත්වලට එරෙහි වන්නවුන්ට වාර්ගික පදනමක් මත පහර ගැසීමේ පෙරනිමිති දැක්වීමක් ද? උත්තරය "ඔව්" වීමට සියලුම සලකුනු ඇත.

ඡන්දය පාවිච්චි කල අතිමහත් බහුතරයකගේ තීරනය තුල වාර්ගිකත්වය ඉටුකලේ ඉතා සුලු කාර්‍යයක් බව පශ්චාත්-මැතිවරන මත විමසුම්වල හා අනෙකුත් මූලාශ්‍රවල සඳහන් වන සාක්ෂි මගින් සනාථ වේ. ඔබාමාගේ පැත්තෙන් ගතහොත්, ඔහු තමා තනි වර්ගයක හෝ පලල් ලෙස ගතහොත් සුලු වාර්ගිකයන්ගේ නියෝජිතයා ලෙස හෝ ඉදිරිපත් වූයේ නැත. කෙසේ වෙතත් ඉතා ප්‍රකට ආකාරයකට නො වුවත් ඔහුගේ වාර්ගික පසුබිම, අප්‍රිකානු-ඇමරිකානු ජනාධිපතිවරයෙක් කම්කරු ජනතාවගේ ශෝචනීය තත්වයට වඩා සානුකම්පිත වනු ඇතැයි යන හැඟීමක් පැවතීමට ඇති ඉඩ තුල, ඔහුගේ දේශපාලන රූපකාය ගොඩනැංවීමේ දී ඉතා වැදගත් කාර්‍යභාරයක් ඉටු කලේය. මෙම සංකල්පය විවිධ මධ්‍යම පාංතික" වම්මුන්" සහ නේෂන් සඟරාව වැනි අවස්ථාවාදී ප්‍රවනතා විසින් ඔහුගේ ජනාධිපතිවරන ව්‍යාපාරයේ සමාජ හා පන්ති අවශ්‍යතා සැඟවීමේ අටියෙන් තොරොම්බල් කරන ලදි.

වාර්ගිකත්වය ගැන ජනමාධ්‍යවල උන්මාදය ප්‍රශ්නයට බඳුන් කිරීම ඇමරිකාව තුල අප්‍රිකානු-ඇමරිකානුවන්ට එරෙහි වාර්ගික පරිපීඩනයේ ඉතිහාසය ඉවත දැමීමක් නොවේ. කෙසේවෙතත් ඇමරිකානු දේශපාලනය අරා හොල්මන් කරනා ඇත්ත ප්‍රශ්නය නම් පන්ති ප්‍රශ්නය යි. නිශ්චිත වශයෙන් ම ඇමරිකාව තුල පන්තිය සම්බන්ධ ප්‍රශ්නය එතරම්ම පුපුරන සුලු බැවින් යම් තනතුරක් සඳහා තරඟ වදින කිසිදු දේශපාලනඥයෙක් "කම්කරු පන්තිය" යන වචන තැතනීමට හෝ නිර්භීත නොවේ.

දශක හතරකට පමන පෙර කාලයක් වන තුරු, ප්‍රගතිශීලී අදහස් දැරූ බුද්ධිමතුන් සහ ලිබරල් මතධාරී දේශපාලන විචාරකයෝ වාර්ගික පරිපීඩනය ඇමරිකානු සමාජයේ පන්ති ආකෘතිය සමග බැඳී පවතින බව පලල්ව පිලිගත්හ. නමුත් 1970 මුල් කාලයේ සිට ඇමරිකානු දේශපාලනය හා බුද්ධිමතුන්ගේ ජීවිතය යටපත් කරගෙන නැගී සිටියේ පන්ති ප්‍රශ්න ප්‍රතික්ෂේප කිරීම යි. ඒ වෙනුවට ලිංගිකත්වය, ලිංගික නැඹුරුව වැනි ද්විතියික කරුනු හා සියල්ලටමත් වඩා වාර්ගිකත්වය, පිලිගත හැකි දේශපාලන සාකච්ඡාවේ ඉසේ සිට දෙපතුලට අරා ගන්නා සේ ඔසවා තැබුනි.

දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතයට අනුව ඇමරිකාව තුල කම්කරු පන්තියක් නැත. එහි ඇත්තේ "මධ්‍යම පන්තිය" පමනි. නීතිඥයන්, දන්ත වෛද්‍යවරුන්, වෙලඳසැල් හිමියන් වැනි අතරමැද සමාජ තට්ටුවක් හැඳින්වීමට කලක් භාවිත කල මෙම පදය දැන් ඉතා ධනවත් හා ඉතා දුප්පත් අය හැර අනෙකුත් සියලු දෙනා හැඳින්වීමට යොදා ගනී. මෙම පාරිභාෂික වචන විප්ලවය (හෝ ප්‍රතිවිප්ලවය), සිය ජීවන අරගලය පඩිපතක් මත යැපෙන ජනගහනයේ අනුපාතයේ වැඩිවීමක් ද සමාජ හා ආර්ථික අසමානතාවයේ අත්‍යසමාන වර්ධනයක් ද සමග සම්පාත වී ඇත. සිය පැවැත්මම ප්‍රතික්ෂේප කරනු ලබන අතරවාරයේ කම්කරු පන්තිය මෙම කාල පරිච්ඡේදය තුල තම සමාජ තත්වයේ ද දැවැන්ත කඩාවැටීමක් අත්දකිමින් සිටී.

අන් කවර තැනකටත් වඩා මෙම සමාජ බාදනය අති දරුනු ප්‍රතිවිපාක අත්කර දුන්නේ කම්කරු පන්තියේ ආර්ථික වශයෙන් පහලම තට්ටුවලට හා විශේෂයෙන් ම අප්‍රිකානු-ඇමරිකානු කම්කරුවන් අතරේය, කර්මාන්තයන්ගේ විශාල පදාසයන් සුනුවිසුනු කර දැමීමෙන් හා සැලකිය යුතු සමාජ බලවේගයක් ලෙස වෘත්තීය සමිතිවල අතුරුදහන්වීම මගින් ඇතුලාන්තර නගර ජරපත් වීම, ඒවායේ රජයේ පාසල් සම්පූර්නයෙන්ම වාගේ කඩා වැටීම, සෞඛ්‍ය සේවයේ හාත්පස පැතිරුනු ඌනතාව, නිවාස හා පොදු කාර්ය ව්‍යුහයේ ගරාවැටීම, දුප්පත්කම හා බැඳුනු දියවැඩියාව වැනි ලෙඩරෝග පැතිරීම හා දීර්ඝකාලීන විරැකියාව වෙත දක්කාගෙන යන ලදි.

අනෙක් පසින් බැලූ කල ඇමරිකානු ලිබරල් මතධාරීන්ගේ සලකුන බවට පත්ව ඇති අනන්‍යතා දේශපාලනය, දේශපාලන තානාන්තර, සමාගම්වල ඉහල පුටු, උසස් අධ්‍යාපන ආයතනවල හා මාධ්‍ය ආයතනවල පදවි ආදියට තම වර්ගය බාධාවක් වීම ඉවත් කෙරුනු අප්‍රිකානු-ඇමරිකානුවන්ගේ පටු කන්ඩායමක් උත්කර්ෂයට නැංවීමේ දී අතිශයින් සාර්ථක වී ඇත. ඔබාමා නියෝජනය කරන්නේ ඉතා බහුතරයක් වූ කලු කම්කරුවන්ගේ අපේක්ෂාවන්ගේ ජයග්‍රහනයක් නොව මෙම වඩා වරප්‍රසාදිත සුලුතරයේ ජයග්‍රහනයකි. ඔහුගේ ජයග්‍රහනය වනාහි කම්කරු පන්තියේ ශ්‍රමයෙන් උකහාගත් ධනයෙන් කුට්ටියක් ලබාගැනීම ගැන ඔවුන්ටත් සැලකිය යුතු බලාපොරොත්තුවක් තබාගත හැකි බව හඟිස්සවන්නකි.

වර්ගය ගැන නිල වසයෙන් පවතින උන්මාදය සහ පන්ති ප්‍රශ්නය යටපත් කර තැබීම යනු ඇමරිකානු ලිබරල් මතවාදයේ බුද්ධිමය ජරපත්වීම හා දක්ෂිනාංශික දේශපාලන ගමන ප්‍රකාශයට පත් කරන්නකි. ඉතිහාසඥ ඇලන් බ්‍රින්ක්ලේ, ඔහුගේ 1995 ලියූ *The End of Reform* (ප්‍රතිසංස්කරනවල අවසානය) නම් පොතේ, රූස්වෙල්ට්ගේ නව සම්මුතිය (New Deal) පිරිහෙමින් පැවති අවුරුදුවල දී ආරම්භ වී, දෙවන ලෝක යුද්ධ කාලයේ දී වඩා වේගවත් වී, පශ්චාත් යුද්ධ කාලයේ දී මැනවින් තහවුරු වුනු ඇමරිකානු ලිබරල් මතවාදයේ විඥානයේ හා දේශපාලනයේ සිදුවූ වැදගත් වෙනසක් ගැන තීක්ෂන ඥානයකින් යුතුව ලියා සිටියේය.

බ්‍රින්ක්ලේ විස්තර කරන පරිදි ඇමරිකානු ලිබරල් මතවාදය, විශේෂයෙන් ම නව සම්මුතියේ මුල්

අවුරුදුවල දී, දැවැන්ත ව්‍යාපාරිකයන්ගේ බලය සීමා කිරීම සඳහා සහ වැඩපල තුල යම් ආකාරයක කාර්මික ප්‍රජාතන්ත්‍රවාදයක් හඳුන්වාදීම සඳහා ඇමරිකානු ධනවාදයේ යලි හැඩගැස්වීමක් පිනිස වූ කැඳවීමට සාමාන්‍යයෙන් සහය දුන්නේය. බොහෝ නව සම්මුතියේ ඩිමෝක්‍රැටික්වරු ධනය යලි බෙදාහැරීමක් හා වඩා පලල් සමාජ සමානතාවක් අත් කර ගැනීම සඳහා වූ පියවරයන්ට සහයෝගය දුන්හ.

කෙසේ වෙතත් 1937 දී සිදුවූ ආර්ථිකයේ අර්ධ ප්‍රකෘතිමත්වීම කඩාවැටුනු පසු සහ මූලික කර්මාන්තවල ඇතිවූ වර්ජන සටන් විප්ලවවාදී පරිමානයන් දක්වා වර්ධනය වීමේ තර්ජනය මතු කල විට, රූස්වෙල්ට් නව කාර්මික වෘත්තිය සමිති හෙලා දැක්ක අතර ඩිමෝක්‍රැටික් පක්ෂයේ ලිබරල් මතවාදය ධනවාදයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරන න්‍යායපත්‍රයෙන් පසුබැසීමට පටන්ගත්තේය. මෙම ක්‍රියාදාමය දෙවන ලෝක යුද්ධය මගින් වඩා වේගවත් කෙරුනි.

බ්‍රින්ක්ලේ කියා සිටින පරිදි 1945 වන විට ඇමරිකානු ලිබරල් මතධාරීහු "පන්ති ප්‍රශ්නවල නිමග්න වීම, නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය ආර්ථික ස්වාධීනත්වය සමග සමාන කිරීම, ඒකාග්‍ර වූ ආර්ථික බලයකට ඇති විරුද්ධත්වය ආදී ප්‍රතිසංස්කරන ගැන පෙර කරන ලද අවධාරනයෙන් ලිබරල් මතවාදය තත්‍ය වශයෙන් ම ඉවත් කර දැමූහ. ඔවුන් මිනිසුන් හා ගැහැනුන් නිෂ්පාදකයන් වශයෙන් ඉටු කරන කාර්‍යභාරය අඩුලංසුවට දැමූ අතර ඒ වෙනුවට පාරිභෝගිකයන් වශයෙන් ඔවුන්ගේ භූමිකාව ඔසවා තබන පරිදි පුරවැසිභාවය යලි අර්ථකථනය කරන ලදි."

මහා වර්ජන අරගල, ෆැක්ටරි වාඩිලාගැනීම් සහ කම්කරු පන්තික ප්‍රජාවම සටනට මෙහෙයවුනු උනුසුමේ ඇතිවුනු, කාර්මික සංවිධාන කොංග්‍රසයේ (සීඅයිඕ) නව කාර්මික වෘත්තිය සමිති මෙම ලිබරල් මතධාරීන්ගේ විඥානයේ හා දේශපාලනයේ සිදු වූ වෙනස්වීමට සහ ඔවුන් විසින් සහයෝගය දෙන ලද රූස්වෙල්ට් පාලනයේ ඉල්ලීම්වලට හැඩ ගැසුනේ, ධනවාදයේ ව්‍යුහමය ප්‍රතිසංස්කරනවලට හා වැඩපල තුල ප්‍රජාතන්ත්‍රවාදයට ඔවුන්ගේ පෙර තිබූ කැඳවීම් ආදී බරබද්දල් මුහුදු බත් කරමිනි. යුධ ප්‍රයත්නයේ අවශ්‍යතාවන් සඳහා, වෘත්තීය සමිති රජය සහ ව්‍යාපාරික නායකයන් සමග සහයෝගිතාවන්ට ඇතුලුවීමත් සමග යුධ කාලය තුල මෙම වෙනස්වීම වඩාත් තහවුරු විය. මෙම යුද්ධ කාලීන සහයෝගිතාවේ කොටසක් වූයේ ඔවුන්ගේ වර්ජන නොකිරීමේ පොරොන්දු හා වැටුප් පාලනයන් ක්‍රියාවේ යෙදවීම යි.

1930 ගනන්වල පන්ති සටන්වල දී සමාජවාදී හා විප්ලවවාදී සංවිධාන සමග සම්බන්ධව සිටි කම්කරුවෝ කේන්ද්‍රීය ක්‍රියාකලාපයක් ඉටු කලහ. මෙම මහජන අරගල සක්‍රිය වූයේ වෘත්තීය සමිති පිලිගැනීම, අඩු වැඩපැය ගනන හා වඩා හොඳ රැකියා තත්වයන් ආදී ඉල්ලීම් මත පමනක් නොව, කාර්මික ආර්ථිකය තුල හා ඇමරිකානු දේශපාලනය තුල කම්කරු ව්‍යාපාරය ස්වාධීන බලයක් බවට පත්කිරීමට වූ උත්සාහයක් ද ඇතිවයි. මෙම කාර්මික ප්‍රජාතන්ත්‍රවාදය ගැන සංකල්පය කම්කරුවන් විශ්වාස කල පරිදි, බ්‍රින්ක්ලේගේ වචනවලින්, "හුදෙක් කම්කරුවන්ගේ ජීවිත පමනක් නොව ඇමරිකානු සමාජයේ ම ස්වභාවය පරිවර්තනය කරනු ඇත."

කෙසේ වෙතත් "ඩිමොක්‍රැටික් පක්ෂය සමග සහ ලිබරල් රාජ්‍යය සමග සන්ධානයක් ගොඩනගා ගැනීම මගින් හා කාර්මික කවුන්සිල සැලැස්ම හෝ කම්කරු පක්ෂයක් ගැන අදහස වැනි වඩා විශාල එල්ලයන් අතහැර දැමීම මගින්, සංවිධානගත කම්කරුවන්ට ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් බවට පත්වීමට තිබුනු අවස්ථාව අතහැර දැමිනි... 1945 වන විට, මෙම ව්‍යාපාරය සාපේක්ෂව පටු (සමහර අවස්ථාවල ලිබරල් මතවාදී නොවන) එල්ලයන් සහිත, තමන් ආයතනිකව නොනැසී පැවතීමට ප්‍රධාන වශයෙන් කැපවූ, අතිශය නිලධාරීවාදී (බොහෝ විට දූෂිත), අවශ්‍යතා කන්ඩායමක් වන එහි වර්තමාන ස්වභාවයට පත්වීමේ මාවතට සම්ප්‍රාප්තව තිබුනි."

මෙම මහ ව්‍යාපාරිකයන්ගේ බලය සීමා කිරීමට හා කර්මාන්ත තුල යම් ප්‍රමානයක ස්වාධීන කම්කරු බලයක් පිහිටුවීමට දරන ලද සියලු උත්සාහයන් අතහැරදැමීම, 1940 ගනන් අග භාගයේ හා 1950 ගනන්වල කොමියුනිස්ට්වාදීන් දඩයම් කිරීම් හා වෘත්තීය සමිතිවල වාමාංශික කොටස් විරේක කර දැමීම් තුල දී එහි අවසන් හා සම්පූර්නයෙන් ම ප්‍රතිවිප්ලවවාදී ස්වභාවය අත්කර ගත්තේය.

පශ්චාත් යුද ඇමරිකානු ලිබරල්වාදයේ හා එය වැලඳගත් "මධ්‍යම පන්තික" පරිභෝජන සමාජයේ විශ්වසනීයත්වය රඳා පැවතුනේ සදානොනිමි සමෘද්ධියෙන් යුතු වූ, යුද්ධයට පසු කාලීනව ආර්ථික වර්ධනයේ නොනවතින ගමනයි. නමුත් 1960 ගනන්වල අගභාගයේ දී වර්ධනයේ බිඳවිසිරීයෑම ආරම්භ විය. වියට්නාම් යුද්ධයේ දරුනු ප්‍රතිඵල, සිවිල් අයිතිවාසිකම් පිලිබඳ අරගල, කඩාවැටෙන ආර්ථික තත්වය මගින් අවුලුවන ලද නාගරික කලකෝලාහල හා වර්ජන රැලි, නව සම්මුතියේ සහයෝගිතාවට යටින් වල කපන ලදි. වසර කිහිපයකට පසු ඩිමොක්‍රැටික් පක්ෂය නව සම්මුතියේ සමාජ ප්‍රතිසංස්කරනවාදී පිලිවෙත් වෙතින් විවෘතවම දුරස්ථ විය.

පාරිභෝගික සමාජය ව්‍යාප්ත කිරීම හරහා ජීවන කොන්දේසි වර්ධනය කරන බවට වූ පොරොන්දු බිඳ වැටෙද්දී, ඩිමොක්‍රැටික් පක්ෂය තමන් ම යලි සකසා ගැනීමකට 1972 මැක්ගවර්න්ගේ ව්‍යාපාරයේ ආරම්භයත් සමග තැත දැරුනි. දුරදිග යන ප්‍රජාතන්ත්‍රවාදී

ප්‍රතිසංස්කරන ලෙස ඉදිරිපත් කෙරුනු මෙහි වර්ගය හා ලිංගික විවිධත්වය, ආදර්ශ පාඨ වූ අතර පන්ති ප්‍රශ්න ගැන වූ කිසියම් සාකච්ඡාවක් මැඩපවත්වන ලදි. අනන්‍යතා දේශපාලනයේ පිලිවෙත පක්ෂය තම ආකෘතියටම ඇතුලත් කර ගත්තේය. විවිධ වාර්ගික හා ජාතික කන්ඩායම් අතරේ සහ ස්ත්‍රීන් අතරේ හුන් සුපිරි තට්ටුවකට වරප්‍රසාද බෙදාදීම සඳහා "සහතික කරන ලද ක්‍රියා" (Affirmative action) සහ ඊට සමාන පිලිවෙත් යොදා ගනු ලැබුනේ, අප්‍රිකානු-ඇමරිකානු හා ලතින් ඇමරිකානුවන් මෙන් ම සුදු මිනිසුන්, ගැහැනුන් මෙන් ම පිරිමින් ආදි වූ පලල් වැඩකරන ජනතාවකගේ ජීවන කොන්දේසි එකතැන පල්වීම හෝ කඩාවැටීම සිදුවුන අතරතුරේ දී ය.

දැන්, 1930ගනන්වලට පසු ඇමරිකානු හා ලෝක ධනවාදයේ ගැඹුරුම ආර්ථික අර්බුදයක තතු යටතේ ඇමරිකානු සමාජය නිශ්වය කරනු ලබන අංගලක්ෂනය ලෙස වර්ගය ඔසවා තැබීම පරීක්ෂාවට බඳුන් කෙරේ. ඔබාමාගේ තේරීපත්වීම වාර්ගික පදනමකින් ඉදිරිපත් කිරීමට මාධ්‍යවල ප්‍රයත්නය තිබියදීම යටපත් නොවී එලියට එන්නේ, ඔහුගේ ජයග්‍රහනය, ඇත්ත වශයෙන් ම, ස්වභාවයෙන් ද්විපාක්ෂික වන යුද්ධයේ හා සමාජ ප්‍රතිගාමීත්වයේ ප්‍රතිපත්තිවලට එරෙහිව එන පන්ති ව්‍යාපාරයක මුල් අවස්ථාවේ කැලඹීම්වල ප්‍රතිඵලයක් යන්න යි.

මෙම මෝදුවන පන්ති අරගලයේ පුනර්ජීවනය, ඇමරිකානු දේශපාලනයේ හා එහි පක්ෂ දෙකේ ඒකාධිකාරයේ රාමුව ඇතුලත, අත්‍යවශයෙන්ම ගන්නේ, විකෘති වූත් හා ප්‍රතිවිරෝධී වූත් පෙර සූදානමක් ලෙස රිපබ්ලිකන්වරු ප්‍රතික්ෂේප කිරීම සහ ඩිමොක්‍රැටික්වරුයකු තෝරාපත් කර ගැනීම යි. නමුත් ඔබාමා ධවල මන්දිරය වෙත තල්ලු කරවූ, සිරවී පවතින කම්කරු පන්තියේ වෛරය සහ අපේක්ෂා භංගත්වය කල් නො යවා ම ඔබාමා වෙත ම එල්ල වනු ඇත.

ඔබාමාගේ තේරීපත්වීම ඇමරිකාව තුල පන්ති අරගලයේ නව කාල පරිච්ඡේදයකට වේදිකාව සකසා දී ඇත.

**බැරී ග්‍රේ**

© www.wsws.org